3 වන පිටෙන්

කලාකාරයන්ට් භාර කිරීමේ ඇති මුග්ධ භාවය අවබෝධ කර ගැනීමට, අඩු වශයෙන් අපේ වර්තමාන නායකයන් ඇතුළු ඇතැම් ශ්‍රී ලාංකිකයන්ටවත් උපකාරි විය හැකිය.

ශ්‍රී ලංකාවේ නායකයන්ගෙන් බොහොමයක් ග්‍රහයෝගත්, ඒවා අර්ථකථනය කරන්නන්වත් විශ්වාස කළහ. එහෙත් ඒ කිසිවෙකු රාජපක්ෂ තරම් රාජ්‍ය බලය සහ සම්පත් පාවිච්චි කරමින් ජ්‍යොතිෂඥයන්ව කරට ගන්ට හෝ ඔවුන්ව වධ හිංසාවට ලක් කිරීමට හෝ ගියේ නැත. බොහෝ දේශපාලඥයන් ඇතුළු බොහෝ දෙනාගේ පෞද්ගලික ජීවිතවල ජ්‍යෝතිෂය කවදත් ඉතා වැදගත් සාධකයක් වී තිබෙන බව අත්ත. එහෙත්, එය රාජපක්ෂ පාලනය යටතේ තරම් ඊට පෙර කිසි විටක. පොදු අවකාශය තුළ ප්‍රධාන ස්ථානයක් ගෙන නැත.

තව අවුරුදු දෙකක් තිබියදී ජනාධිපතිවරණයකට යාම සඳහා පමණක් නොව, සුභ මොහොතක් බලා මැතිවරණ කොමසාරිස්වරයාට නාම යෝජනා භාර දීමේ සිට එම මැතිවරණය තුළ ඔහු කළ කී සියලු දෑ ද බොහෝ කොට තීන්දු කෙරුණේ ජ්‍යොතිෂඥයන්ගේ උපදෙස් අනුවයි. මෙතරම් මිථ්‍යාමතික නැති රටවල ජනමත විචාරණ ආයතන සහ දත්ත විශ්ලේෂක ආයතනවලට හිමි වන ස්ථානය ලංකාවේ මැතිවරණ ව්‍යාපාරය තුළ හිමි වුණේ ජ්‍යොතිෂඥයන්ටයි. උදාහරණයක් වශයෙන්, රජයේ රූපවාහිනිය මැතිවරණ අනාවැකි කියැවීමට ගෙන්වුයේ ජ්‍යොතිෂඥයන්වයි. මේ හිඟින භාවිතය වැඩි කල් නොගොස් පෞද්ගලික රූපවාහිනී නාලිකාවන්ටද බෝ විය.

රාජපක්ෂ පරාජයේ වඩාත් සාධනීය එක් අංගයක් වන්නේ, ජ්‍යොතිෂය පොදු අවකාශයෙන් පෞද්ගලික අවකාශයට යළි තල්ලු කර දැමීමට හැකි වීමයි. මෑතක පළ වූ ඇතැම් මාධ්‍ය වාර්තා අනුව, සිරිසේන*විජේසිංහ පාලනයත් ඒ නරුම අතීතයට අඩියක් දෙකක් තියන අවස්ථා නැතුවා නොවේ.

වර්තමානය තුළ අතීතය

තමන්ගේ න්‍යාය පත්‍රයට නොගැලපෙන අනාවැකියක් කී ජ්‍යොතිෂඥයෙකුව අත්අඩංගුවට ගනිමින් රාජපක්ෂලා ඉතිහාසගත විය. විපක්ෂයට හිතවාදී යැයි සැළකුණු ජ්‍යොතිෂඥයෙකු වූ චන්දසිරි බණ්ඩාර එදා පැවති පාලනය ගැන අශුභ අනාවැකියක් කී විට රාජපක්ෂලා ප්‍රතිචාර දැක්වූයේ සහාසිකවයි. ඔහුව අත්අඩංගුවට ගෙන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙන ගොස් දීර්ඝ වශයෙන් ප්‍රශ්න කරන ලදි.

ඉන් පෙර නොවූ විරූ ඒ මර්දනකාරී පියවරෙන් අපේක්ෂා කළ ප්‍රතිඵල හැරෙන තැපෑලෙන්ම ආවේය. හිරහාරයෙන් ගිඳහස් වී චන්දසිරි මහතා එළියට ආවේ, ඉතා ආරක්ෂා සහිත, අළුත උපන් රාජපක්ෂවාදියෙකු වශයෙනි. ඒ කෙතෙක්ද යත්, 2015 ජනාධිපතිවරණයේදී රාජපක්ෂගේ තිරසාර ජයග්‍රහණය සපථ කොට සිටි ඔහු, එසේ නොවුණහොත් තමා වෙඩි තියාගෙන මැරෙන බව රූපවාහිනී සජීවී වැඩ සටහනක් හරහා රටට කියා සිටියේය.

වර්තමාන ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහතා පිළිබඳ අනාවැකියක් කී, වත්මන් ආණ්ඩුව පිළිබඳ විවේචකයෙකු වශයෙන් දන්නා විජිත රෝහණ විජේමුනිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීය. (ඔහුගේ විකිපීඩියා පිටුවේ දැක්වෙන පරිදි, ඔහු ප්‍රසිද්ධියට පත්වුණේ, හමුදා ආචාර පෙළපාලියකදී තම බයිනෙත්තුවෙන් රජිව් ගාන්ධිට පහර දුන් නැවියා වශයෙනි. පසුව, සිංහල උරුමයෙන් ඔහු මැතිවරණයටත් ඉදිරිපත් වුණි). හෙණ ගහන අපරාධ බහුල වශයෙන් සිදුවෙන අවස්ථාවක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ජ්‍යොතිෂඥයන් පස්සේ මෙස් පත්නන්නේ, ජ්‍යොතිෂ ප්‍රලාප යනු සත්‍යයම මිස වෙන කිසිවක් නොවෙතැයි දේශපාලඥයන් තවමත් විශ්වාස කරන බැව්හි.

වාසනාවට, 2016 යනු 2009 නොවේ. වර්තමාන ආණ්ඩුවත් මිථ්‍යා පිළිසරණ හෝ ඒකාධිපති විසඳුම් කෙරෙහි පෙළඹෙයි. එහෙත්, 2015 ජනවාරි මාසයෙන් පසු ඇති වූ වෙනසට ස්තූතිවන්ත වන්නට, එවැනි පිළිසරණ පස්සේ හඹා යාමේ ඉඩකඩ අද හැකිලී තිබේ.

2009 දී එක් ජ්‍යොතිෂඥයකුව අත්අඩංගුවට ගෙන දීර්ඝ වශයෙන් ප්‍රශ්න කරන ලදි. 2016 දී අත්අඩංගුවට ගත් අනිත් ජ්‍යොතිෂඥයා කෙළේ, දැනටමත් තමා කටඋත්තරයක් දී ඇති බැවින් තවදුරටත් කරදර කළහොත් මාතව ගිම්කම් කොමිසමට පැමිණිලි කිරීමට පියවර ගන්නා බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දන්වා සිටීමයි.

2009 දී අත්අඩංගුවට පත් රාජපක්ෂ*විරෝධී ජ්‍යොතිෂඥයා එළියට එන විට රාජපක්ෂවාදි බැලයෙකු වී තිබුණි. 2016 දී අත්අඩංගුවට පත් ජ්‍යොතිෂඥයා තම දේශපාලන පාට වෙනස් කෙළේ හෝ පොලිසිය පිස්සු වැටිටු අදාළ වීඩියෝ පට මකා දැමුවේ හෝ නැත. මේ දෙදෙනා අතර ඒ වෙනසට හේතු වුණේ, 2015 ජනවාරි මාසයේ ඇති වූ ප්‍රජාතන්ත්‍රවාදී වෙනසයි.

ශ්‍රී ලංකාව යනු යහපාලනයේ පාරාදීසයක් නොවේ. එහෙත් ගිසකවම එය කලින් තිබුණාට වඩා එය යහපත් රටකි.

ජගත් සන්තුෂ්ටිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ 2013 වාර්තාවට අනුව ශ්‍රී ලංකාව යනු මේ මහ පොළොව මත පිහිටි වඩාත් දුක්බදායි රටවල්වලින් එකකි. රටවල් 156 ක් අතරින් එදා ශ්‍රී ලංකාවට හිමි වුණේ 137 වැනි ස්ථානයයි. 2016 වන විට ශ්‍රී ලංකාව ඒ සූචිය තුළ 117 වැනි ස්ථානයට පත්ව වර්ධනය වී සිටී. තව යාමට ඇති දුර බොහෝ ය. එහෙත් දිසාව හිවැරදි ය. ආර්ථිකය හරහට නොසිටියොත්, තව අත්කර ගත හැකි ජයග්‍රහණ බොහෝ ය.

මිථ්‍යා විශ්වාස කෙරෙහි පූර්ණ භක්තියෙන් සිටි රාජපක්ෂලා විද්‍යාව විශ්වාස කෙළේ නැත. තමන්ගේ ජන්ද පදනම තුළ ඇති වෙමින් තිබූ අසහනය පිළිබඳ කල්තියා එළිදුටු එක් අනතුරු ඇඟවීමක් ඔවුන් නොසළකා හැරියේ එබැවිනි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 2011 දී පැවැත්වූ සමීක්ෂණයකට අනුව, ඉදිරි වසර දෙක තුළ රටේ සාමාන්‍ය ආර්ථික තත්වය වර්ධනය වෙතැයි සිංහලයන්ගෙන් සියයට 70 ක් විශ්වාසය පළ කළහ. එම ආයතනය මගින් 2013 දී කළ සමීක්ෂණයේදී එම විශ්වාසය දරා සිටියේ සිංහලයන්ගෙන් 38.5 ක් පමණි. අවුරුදු දෙකක් වැනි කෙටි කාලයක් තුළ මොන තරම් ගරාවැටීමක්ද?

ජ්‍යොතිෂඥයන්ගේ අනාවැකිවල එල්ලෙනවා වෙනුවට මෙවැනි වාර්තා පිළිබඳ සැළකිලිමත් වුයේ නම් රාජපක්ෂලා 2015 දී පරාජය නොවන්නටත් ඉඩ තිබුණි.

වැරදි බදු පනතේ අත්‍යාවශ්‍ය භාවය ගැන වර්තමාන ආණ්ඩුව අනන්තවත් ප්‍රචාරකවාදි වැඩපිළිවෙළවල් දියත් කළ හැකිය. සාමාන්‍ය ජනතාවට එයින් හානියක් නොවෙනැයි දස අතේ දිව්‍රා කිව හැකිය. එහෙත්, බඩුවක් මිළදී ගැනීමේදී හෝ දුරකථන ඇමතුමක් ගැනීමේදී හෝ වෛද්‍යවරයෙකු වැනල් කිරීමේදී පාරිභෝගිකයාට දැනෙන වෙනස, එම ප්‍රචාරණයන් හිසා වෙනස් වන්නේ නැත. එවිට ඔවුනු අපේක්ෂා භංගත්වයට පත්වෙති. හරියට, 2011 සහ 2013 අතර කාලයේදී මෙති.

මේ ආණ්ඩුවත් වැරදි කළ හැක. එසේ කොට, බලය පවත්වා ගැනීමටත් යම් තාක් හැකි වනු ඇත. එහෙත් රාජපක්ෂලා කළ වැරදිම මොවුනුත් කරන්නේ නම්, අපේ අනාගතය 2015 ජනවාරියේදී අප ගැලවී ආ අතීතයෙන් වෙනස් නොවනු ඇත.

රාජපක්ෂ පාලනය යටතේ පැවති දූෂණය, පවුල්වාදය සහ වෙනත් බොහෝ අක්‍රමිකතාවන්ගෙන් අප තවමත් ගැලවී නැත. එහෙත්, රාජපක්ෂලාගේ කාලයේ පැවතියාට වඩා යහපත් ආණ්ඩුකරණයක් අද අපට තිබේ.

පියවර දෙකක් ඉදිරියට ගොස් එක පියවරක් පස්සට තැබුවත්, ඉදිරියට යා හැක. එහෙත් එක පියවරක් පමණක් ඉදිරියට තබා පියවර දෙකක් පස්සට ගියොත් නතර වන්නේ අර කී අතීතයෙන්මයි.

අත නැර ඉදිරියටම

ඇමරිකාවේ ඩොනල්ඩ් ට්‍රම්ප්ට ප්‍රතිවාදීව හිලරි ක්ලින්ටන් අත්කර ගෙන සිටි විශාල ජනප්‍රියත්වය භයානක අන්දමින් වැරි යන බව තේරී සිල්වර් ජනමත විචාරණයේදී හෙළි විය. එහිදී, මීට කලකට පෙර ඩිමොක්‍රටික් පක්ෂයේ ජනාධිපති අපේක්ෂකත්ව නියෝජනය ලබා ගැනීම සඳහා හිලරි ක්ලින්ටන්ට ප්‍රතිවාදීව සිටි බර්නි සැන්ඩර්ස් එම සතියේදීම, තමාගේ අතීත ප්‍රතිවාදියාගේ සහායට එක පයින් ඉදිරිපත් විය. හිලරි ක්ලින්ටන් පිළිබඳ විශාල ප්‍රසාදයක් අද පවා බර්නි සැන්ඩර්ස්ට නැත. එහෙත්, ට්‍රම්ප්ව පරාජය කළ හැකි එකම මග හිලරි ක්ලින්ටන්ගේ ජයග්‍රහණය වෙනුවෙන් පෙනී සිටීම බව බර්නි සැන්ඩර්ස් නිගමනය කෙළේය. මෙම මැතිවරණය, තුන්වැනි පාර්ශ්වයක් වෙනුවෙන් ඡන්දය නාස්ති කර ගැනීමට හෝ ඡන්දය නොදා ගෙදරට වී සිටීමට හෝ අවස්ථාවක් නොවන බව, හිලරි ක්ලින්ටන් ගැන අවිශ්වාසයෙන් සිටි තම අනුගාමියන් අමතා බර්නි සැන්ඩර්ස් කීය. එකම ගැලවීමකට ඇත්තේ, ඩොනල්ඩ් ට්‍රම්ප්ව පරාජය කොට හිලරි ක්ලින්ටන්ව ජයග්‍රහණය කැරැවීම සඳහා ජනතාව පෙළ ගැස්වීම පමණක් බව ඔහු අවධාරණය කෙළේය.

2015 දී, ශ්‍රී ලාංකිකයන් වන අපි, අපේ ඩොනල්ඩ් ට්‍රම්ප්ව පරාජය කෙළෙමු.

රාජපක්ෂ පාලනය යටතේ පැවති දූෂණය, පවුල්වාදය සහ වෙනත් බොහෝ අක්‍රමිකතාවන්ගෙන් අප තවමත් ගැලවී නැත. එහෙත්, රාජපක්ෂලාගේ කාලයේ පැවතියාට වඩා යහපත් ආණ්ඩුකරණයක් අද අපට තිබේ.

උදාහරණයක් වශයෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය ගන්න. එය, ශ්‍රී ලංකාව එතෙක් අත්දැක ඇති වෙනත් ඕනෑම ක්‍රියාවලියකට වඩා විවෘත ය. එසේම, පෙර නොවූ විරූ අයුරින් සියල්ලන්ව ඊට ඇතුළත් කර ගැනීමට උත්සුක ය. අළුත් ආණ්ඩුක්‍රම සකසා ගැනීමේදී වේවා, පවතින ආණ්ඩුක්‍රමයට නව සංශෝධන ගෙන ඒමේදී වේවා, අතීතයේදී අප ක්‍රියා කොට ඇත්තේ ඉහළ සිට පහළටයි. එනම්, කළ යුත්තේ කුමක්දැයි නායකයන් විසින් තීරණය කරනු ලැබ, ඔවුන්ගේ නිගමනය ජනතාව මත පැටවීමයි. ඊට ඉඳුරා වෙනස් ආකාරයකින් නව ආණ්ඩුව, අළුත් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ සියල්ලන්ගේ අදහස් විමසා සිටී.

එතෙක් අඳලේ තෙම්පරාදු වෙමින් තිබූ වැදගත් ප්‍රශ්න කිහිපයක්, මේ නව විවෘත භාවය තුළ අද කරළියට විත් තිබේ. එයින් එකක් වන්නේ රාජ්‍යයේ ලෞකික භාවය පිළිබඳ ප්‍රශ්නයයි. 1970 දී අමාත්‍ය කොල්වින් ආර්. ද සිල්වාට සංදේශයක් ඉදිරිපත් කරමින් ලංකා හේතුවාදී සංගමයි, ලෞකික ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථාවක් උදෙසා ඉදිරිපත් කරන ලද තර්ක, එදාටත් වඩා අදට ගැලපෙයි. ඇත්තෙන්ම, 1972 දී හඳුන්වා දෙන ලද සහ පසුව 1978 දී තවත් ශක්තිමත් කරන ලද, බුද්ධාගමට ප්‍රමුඛ ස්ථානය ලබා දීමේ වගන්තිය, මෑත කාලීන ප්‍රපංචයකි. ඒ වන තෙක් එවැනි වගන්තියක් අපේ ව්‍යවස්ථාව තුළ තිබුණේ නැත. එසේ වුවද, බුද්ධාගම එදා ආවාට ගියාට තිබුණා නොව, එය මල්එල ලා වැඩීමක්ද පෙන්නුම් කෙළේය. මෙහිදී, සාසනයේ සුභසිද්ධිය සහ අභිවෘද්ධිය වෙනුවෙන් මහා පරිනිබ්බාන සූත්‍රයේදී බුදුන් වහන්සේ දැක්වූ කොන්දේසි අතරේ කිසි තැනක රාජ්‍ය අනුග්‍රහය හෝ විශේෂ ආරක්ෂාවක අවශ්‍යතාවක් පිළිබඳ සඳහනක් නැති බව සඳහන් කිරීම වටනේය.

මෙතෙක් කල් තහනම් මාතෘකාවක් වශයෙන් තිබී දැන් විවෘත භාවය ඔස්සේ කතාබහට ලක්ව ඇති තවත් වැදගත් කාරණයක් වන්නේ, "කාන්තා ප්‍රියාකාරී ජාලය"

14 වන පිටට

සන්නාසය Cartoon by PK